# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
**காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்**
**LAND COMMISSIONER GENERAL'S DEPARTMENT**

ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
**No: 1200/6, Rajamalwatta Road, Battaramulla.**


මගේ අංකය / எனது இல / MY NO } 3/සං/1/ප්‍රතිපත්ති

ඔබේ අංකය / உமது இல / YOUR NO }

දිනය / திகதி / DATE } 2015.12. 23

චක්‍රලේක අංකය 2015/06
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය /සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),

<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගැණුම් මිල අයකර බලපත්‍ර නිකුත් කිරීමේදී ඉඩම් තක්සේරු කිරීම</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් කච්චේරි පවත්වා ගැණුම් මිල අය කිරීමට යටත්ව බලපත්‍ර ලබා ගැනීම සඳහා සුදුසුකම ලබන පුද්ගලයින්ට එසේ බලපත්‍ර නිකුත් කිරීමේ දී අදාළ ඉඩම් කැබලි සඳහා අය කළ යුතු ගැණුම් මිල තීරණය කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉඩම් තක්සේරු කරවා ගත යුතුවේ. එහෙත් මෙම තක්සේරු කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු ද ප්‍රමාද වන බවටත්, එම නිසා අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමේ අපහසුවක් පවතින බවටත් ප්‍රාදේශීය ලේකම්වරුන් මා වෙත නිරන්තරයෙන් පෙන්වා දී ඇත. අදාල ඉඩම් තක්සේරු කිරීම සඳහා පිඹුරු ඉල්ලා සිටීම හේතුවෙන් ඉඩම මැනීමට ප්‍රමාද වීම නිසා තක්සේරුව ලබාදීම බොහෝ ප්‍රමාද වන බවත් වැඩිදුරටත් පෙන්වා දෙනු ලැබ ඇත.

මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස උපදෙස් දෙමි.

I. මෙසේ බෙදාදීමට තීරණය කරනු ලබන ඉඩම් කැබලි සඳහා ගැණුම් මිල අය කිරීම පිණිස තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකිරීම. ( පිඹුරුපත් ඉල්ලා සිටින්නේ නම් මැනුම් නියෝග යවා මැනීමෙන් පසුව එසේ කිරීම)

II. ඒ අතරතුර ග්‍රාමසේවා නිලධාරී මඟින් නිර්දේශ ලබාගෙන ප්‍රාදේශීය ලේකම් විසින් අදාල ඉඩම ගැණුම් මිල අය කිරීම සඳහා දළ වශයෙන් තක්සේරු කිරීම.

III. එම දළ තක්සේරු වටිනාකම අනුව මුදල් අය කර බලපත්‍රයේ පහත සඳහන් කොන්දේසිය වෙනත් කොන්දේසි සඳහන් කරනු ලබන ස්ථානයේ සටහන් කර බලපත්‍ර සකස් කර නිකුත් කිරීම.
"මෙම ඉඩමට අදාල නියමිත ගැණුම් මිල ප්‍රධාන තක්සේරුකරු මඟින් තක්සේරුකරවා තීරණය කරන තෙක් දළ තක්සේරුවක් නියම කර ඇත. නියමිත තක්සේරුව ලැබුණු පසු නියම කරනු ලබන අයකළ යුතු ශේෂයක් වෙතොත් එය ගෙවීමට අවසරපත්‍රකරු යටත්වේ. එය පැහැර හැරියහොත් මෙම අවසරපත්‍රය අවලංගු වේ."

IV. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නියමිත ගැණුම් මිල තක්සේරු කිරීමෙන් පසුව බලපත්‍රකරුගෙන් අයකරන ලද මුදලට වඩා වැඩි වන්නේ නම් එම ශේෂය බලපත්‍රකරු වෙත දන්වා අය කර ගත යුතුවේ. එසේ අයකිරීමේදී ගෙවීම සඳහා සාධාරණ කාල සීමාවක් ලබාදිය යුතු අතර නියමිත කාලසීමාව තුළ ගෙවීම පැහැරහැරියහොත්, බලපත්‍රය කොන්දේසි කඩ කිරීම යටතේ අවලංගු කිරීමට නියමිත නීතිමය ක්‍රියා පටිපාටියට අනුව පියවර ගත යුතුය. මෙසේ බදු මුදලේ වෙනස අය කිරීමේදී බලපත්‍රකරුගේ ඉල්ලීම සලකා බලා ගෙවීමට ලබාදුන් කාලය තවදුරටත් දීර්ඝ කිරීමට සලකා බැලීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට හැකියාව ඇත. එම කාලසීමාව තුළ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව ලබාගැනීමට හැකියාව ඇති බැවින් දළ තක්සේරුව හා එම තක්සේරුව අතර වෙනසක් වෙතොත් එය ඉතිරි වාරික වලට එකතුකර අය කිරීමට ක්‍රියාකළ හැක.


කාර්යාලය / பொது / General } 0112-797400
ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112-864051
ඊමේල් / ஈ-மெயில் / E-mail } info@landcom.gov.lk

V. හිඟ මුදල අය කළ විට ඒ බවට බලපත්‍ර ලෙජරයේ සටහනක් යෙදිය යුතුය. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉඩම තක්සේරු කරන තෙක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් දළ තක්සේරුවක් ලබාගැනීමේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දෙනු ලබන තක්සේරු මුදලට වඩා තම තක්සේරු වටිනාකම වැඩි නොවන සේ දළ තක්සේරුව ලබාදීමට උත්සහය දැරිය යුතු බවත් යම් ලෙසකින් එම දළ තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවට වඩා වැඩි වුවහොත් අතිරික්ත මුදල ආපසු නොගෙවන බවත් සැලකිය යුතුය.

ගැණුම් මිල අයකිරීම යටතේ බලපත්‍ර ලබාදෙනු ලබන බාණ්ඩ පිළිබද සමහර ප්‍රාදේශීය ලේකම්වරුන් වැරදි අර්ථකථනයන් මත ක්‍රියාකරනු ලබන බවට වාර්තා වී ඇත. එම නිසා ගැණුම් මිල අයකර බලපත්‍ර දීමට සුදුසුකම් ලබන්නේ දැනට පවත්නා අංක 1843/50 හා 2014.01.03 දින දරණ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත බාණ්ඩ අනුව ගොවි පන්තිය හැර අනෙකුත් බාණ්ඩ සඳහා බව කාරුණිකව සලකන්න.

ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් ඉඩම් බෙදාදීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.ආර් රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්
1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා
3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා